# වාරිමාර්ග ජලය කළමනාකරණය කිරීම සඳහා මහජන සහභාගීත්වය ලබා ගැනීමේ වැදගත්කම: අම්පාර දිස්ත්‍රික්කයේ ගොවි සංවිධාන ආශ්‍රයෙන්

Faculty of Social Sciences
University of Kelaniya
Sri Lanka

ඩබ්.එම්.එන්. මාධවී [1]

ඒ. එම්.එන්. චාමින්ද අබේසිංහ [2]

**සංක්ෂේපය**

ශ්‍රී ලංකාව අතීතයේ සිටම කෘෂිකර්මික ආර්ථීක ක්‍රමයකට උරුමකම් ඇති රාජ්‍යයකි. ලාංකිකයින් විසින් මහා වාරිමාර්ග, සුළු වාරිමාර්ග හා මධ්‍යම ප්‍රමාණයේ වාරිමාර්ග උපයෝගී කරගෙන කෘෂිකාර්මික කටයුතු , ජල විදුලිය හා අනෙකුත් මිනිස් අවශ්‍යතාවන් සඳහා ජලය ලබා ගනු ලැබේ. එහෙයින් ජලය කළමනාකරණය සඳහා අතීතයේ පටන්ම ලංකාවේ වැදගත් ස්ථානයක් හිමි වී තිබේ.

වර්තමානයේ දී ලෝකයේ ජල අර්බුදයක් නිර්මාණය වීමට ඉඩකඩ ඇති බව ලෝක විද්වතුන් විසින් පවසනු ලැබ ඇත. එයට හේතු ලෙස ඔවුන් පෙන්වාදෙන්නේ ලෝකයේ වැඩිවන ජනගහනයේ ජල ඉල්ලුමට සාපේක්ෂව ජලය සැපයීමට තිබෙන ජලය ප්‍රමාණවත් නොවන බවය. එනම් 1950 වන විට බිලියන 3ක් වූ ලෝක ජනගහනය පරිභෝජනය කළ ජල ප්‍රමාණයේ ඉල්ලුම 2006 වන විට බිලියන 6.3 ක් ලෙස වර්ධනය වී ඇත. ඒ අනුව ජල අර්බුදයට පිළියමක් වශයෙන් ලෝක බලවතුන්ගේ අවධානය යොමු වී ඇත්තේ ජලය පෞද්ගලීකරණය කිරීම පිළිබඳවය. වර්තමානයේ ලංකාවේ ද ඒ සම්බන්ධයෙන් විශාල කතිකාවතක් ගොඩනැගී ඇත. ඒ අනුව ලංකාවේ ජල සම්පත කළමනාකරණය කර ගැනීම සඳහා මහජන සහභාගීත්වය ලබා ගැනීම වැදගත්ය.

මෙම පර්යේෂණයේ අරමුණ වූයේ කෘෂිකර්මාන්තයේ දී වාරි ජලය කළමනාකරණය කිරීම සඳහා මහජනතාවගේ සහභාගීත්වය ලබා ගැනීමෙන් ජල කළමනාකරණයේ කාර්යක්ෂමතාවක් සිදු වී තිබේ ද යන්න සොයා බැලීම වේ. මේ සඳහා සිද්ධි අධ්‍යයන ක්‍රමවේදය භාවිත කරන ලදි. නියැඳිය ලෙස අම්පාර දිස්ත්‍රික්කයේ පවතින ගොවි සංවිධාන අතරින් රජවැව පහළ යාය ගොවි සංවිධානය තෝරා ගන්නා ලදි. මෙම පර්යේෂණය සඳහා ප්‍රාථමික හා ද්වීතීයික දත්ත මගින් තොරතුරු රැස්කර ගනු ලැබීය. එසේ ලබා ගත් තොරතුරුවල ප්‍රමාණාත්මක දත්ත සරල සංඛ්‍යාන ක්‍රමය මගින් ද ගුණාත්මක දත්ත විස්තරාත්මක ක්‍රමය මගින් ද විශ්ලේෂණය සිදු කරනු ලැබීය.

මෙම අධ්‍යයනයෙන් සිදු කළ පර්යේෂණයෙන් එළඹුණු නිගමන ධනාත්මකව හා නිෂේධනාත්මකව හඳුනා ගත හැකි විය. ඒ අනුව ප්‍රතිචාරීන්ගෙන් බහුතරයක් ඔවුන්ගේ සහභාගීත්වයෙන් ඉදිකරන ලද වාරි නිර්මිතයන් සාර්ථකය යන්න ධනාත්මක අදහසක් ඉදිරිපත් කර තීබීම හඳුනා ගත හැකිවිය. මේ අනුව මහජන සහභාගීත්වය ලබා ගෙන වාරි නිර්මාණ සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීමෙන් තුළින් කාර්යක්ෂම ජල කළමනාකරණයක් පවත්වාගත හැකිය. තව ද වාරි නිර්මිතයන්ගේ නඩත්තුව සඳහා ප්‍රතිචාරීන්ගේ සහභාගීත්වය හොඳ මට්ටමක පවතින බව ද හඳුනා ගත හැකි විය. මෙම පර්යේෂණයෙන් හඳුනාගනු ලැබූ නිෂේධනාත්මක අදහස් කිහිපයකි. එනම් ඇළ රක්ෂිතවල වගා කිරීම, ජලයේ ගුණාත්මක භාවයට හානි කිරීම හා ගොවීන් එකිනෙකා අතර පවතින සහයෝගය නොමැතිකම නිසා ජලය අපතේ යන ප්‍රමාණය වැඩි බව යනාදියයි.

මුඛ්‍ය පද : ජල කළමනාකරණය, ජල අර්බුදය, ජලය පෞද්ගලීකරණය, මහජන සහභාගීත්වය, කෘෂිකර්මාන්තය

1 niroshamadhavi@gmail.com ආර්ථීක විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

2 ජ්‍යෙෂ්ඨ කථීකාචාර්ය, ආර්ථීක විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය